මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

නර්තනය I කොටස 11 ශ්‍රේණිය

නම :...................................................................... වි.අංකය:............................ කාලය පැ.1 යි.

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන හෝ පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. සිංහල ගැමි නැටුම් සඳහා ..................... යන උපකරණ භාවිතා කරනු ලැබේ.
   1. කළා, උඩැක්කි, පන්දු
   2. දෑකැත්ත, ලී, මෝල්ගස්
   3. කළ, කුළු, කාවඩිය
   4. දෑකැත්ත, ලී, කාවඩිය

02. කෝලම් නාටකයේ චරිත නිරූපණයේදී ............. අධි මානුෂ චරිත ලෙස සැලකේ
   1. ගුරුළු රාක්ෂ, මරු රාක්ෂ, නාග කන්‍යා
   2. නාගරාක්ෂ, නාග කන්‍යා, කාපිරි
   3. නාග රාක්ෂ, නාග කන්‍යා, සිංහ
   4. ගුරුළු රාක්ෂ, නාග රාක්ෂ, වලස්

03. ගුරුහාමි යනු සොකරියේ .................
   1. ස්වාමියාය
   2. මෙහෙකරුය
   3. වෙද මහතාය
   4. ඇඳුරාය

04. දෙසුළු මහ තුන්තිතට අයත් වන්නේ,
   1. 3 + 3 + 4
   2. 2 + 3 + 4
   3. 2 + 2 + 4
   4. 2 + 2 + 3

05. ''සිරස සවන් යුග මුඛතුල බෙල්ලේ .....'' මෙම කවිය පදය අයත් වන්නේ,
   1. ග්‍රහපන්ති කවි වලටය
   2. සිරසපාද කවි වලටය
   3. මල්යහන් ක විවලටය
   4. කඩතුරා කවි වලටය

06. උඩරට වන්නම් රචනය සඳහා සම්බන්ධ වූ පුද්ගලයෙකු ලෙස සැලකේ
   1. ගණිතාලංකාර බමුණා
   2. ශ්‍රී වික්‍රම රාජසිංහ රජු
   3. සරණංකර හිමි
   4. රාජාධිරාජසිංහ රජු

07. සොබවන් දෙව්වරු සඳෙනෙක් එතැනට ....... චාමර සැලුවේ මුණිදුට .....'' යන කවි පදයේ හිස් තැනට අදාල වචනය වන්නේ,
   1. බසිමින්
   2. දරමින්
   3. අල්ලා
   4. දමමින්

08. කරදිය මුද්‍රා නාට්‍යය ................. මහතාගේ නිර්මාණයකි.
   1. මුදියන්සේ දිසානායක
   2. චිත්‍රසේන ඩයස්
   3. ජයසේන කෝට්ටේගොඩ
   4. එස්. පණීභාරත



Created by Universal Document Converter

09. කෝලම් නාටක රඟ මඩල හඳුන්වනු ලබන්නේ,
1. කරලිය නමිනි
2. වේදිකාව නමිනි
3. තානායම්පෙළ නමිනි
4. කෝලම් පාල නමිනි

10. මුසලඬි වන්නමේ තාල රූපයක් වන්නේ,
1. 3 + 4 / 2 + 2
2. 3 + 4 / 3 + 3
3. 2 + 4 / 3 + 3
4. 4 + 3 / 3 + 3

11. පිළිවෙලින් ශාන්ත හා විශ්මය රසයක් දැක්වෙන්නේ,

1. A හා B රූපවලය
2. A හා C රූපවලය
3. B හා C රූපවලය
4. B හා A රූපවලය

12. ඌරා යක්කමේදී භාවිතා කරන දෙබස් හා ගීත අයත් වන්නේ,
1. ආහාර්ය අභිනයටය
2. වාචික අභිනයටය
3. ආංගික අභිනයටය
4. සාත්වික අභිනයටය

13. ආගමික අවස්ථාවල භාවිත වාදන අවස්ථාන ලෙස සැළකෙන්නේ
1. රණබෙර හා අණබෙර වාදනය
2. හේවිසි හා රථාබෙර වාදනය
3. රථාබෙර හා මගුල්බෙර වාදනය
4. තේවා හා හේවිසි වාදනය

14. භරතමුණි විසින් නාට්‍ය ක්‍රමවේදයක් පිළිබඳව පලකරන ලද ග්‍රන්ථය වන්නේ
1. නාට්‍ය ශාස්ත්‍රය
2. අභිනය දර්පනය
3. භගවත් ගීතාව
4. සිලප්පදිකාරම්

15. මෙම රූපයේ දැක්වෙන චරිත දෙක වන්නේ
1. වෙදරාල හා සොකරියයි
2. වෙදරාල හා නොංචි අක්කාය
3. සොකරී හා ගුරුහාමිය
4. ජසයා හා ලෙංචිනා

16. වන්නම් හා සින්දු වන්නම් නැටීමේදි එහි පද නරත්නයට යොදාගනු ලබන්නේ
1. ප්‍රකාශනාත්මක චලන
2. භාවාත්මක චලන
3. අභි චලන
4. තාලානුකූල චලන

17.



Created by Universal Document Converter

මෙම රූප රාමුවෙහි දැක්වෙන ළමා මුද්‍රා නාට්‍යයෙහි නිර්මාතෘවරිය වන්නේ,

1. අංජලිකා චිත්‍රසේන මහත්මියයි  2. මිරැන්ඩා හේමලතා මහත්මියයි
3. වජිරා චිත්‍රසේන මහත්මියයි  4. චන්ද්‍රලේඛා පෙරේරා මහත්මයයි

18. ප්‍රස්තාරකරණයේදී නොඇදෙන මාත්‍රා හඳුන්වනු ලබන්නේ

1. ලඝු නමිනි  2. ප්ලුත නමිනි
3. ගුරු නමිනි  4. ද්‍රැත නමිනි

19. ''සම්මා සම්බුද්ධ ඥානේන ....'' යන ගායනය

1. නමස්කාරයකි  2. ග්‍රහපන්තියකි
3. සන්නයකි  4. සිරසපාදයකි

20. ''එදා හෙළදිව'' කෘතිය රචනා කරන ලද්දේ

1. ජෝන් ඩේයිලි විසිනි  2. රොබට් නොක්ස්
3. ස්පිල්බර්ජන් විසිනි  4. ෆාහියන් විසිනි

21. කුදාංත ගතදොම් වට්ටම නර්තනය කරනු ලබන්නේ,

1. දෙසුළු මහ තුන්තිතට  2. දෙසුළු මැදුම් තුන්තිතටය
3. දෙමැදුම් මහ තුන්තිතටය  4. සුළු මහ දෙතිතටය

22.

ඉහත රූපරාමුවෙහි දැක්වෙන්නේ ඉන්දීය නර්තන අවස්ථාවකි. එහි වාද්‍ය භාණ්ඩ ලෙස යොදාගනු ලබන්නේ.

1. මද්දලය හා මෘදංගයයි  2. නටුවාංගම් හා මෘදංගයයි
3. වෙන්ඩාව හා මද්දලයයි  4. වෙන්ඩාව හා එඩැක්කයි

23. ''කච්ච කෙට්ට'' නම් අභ්‍යාස පුහුණුව ලබාදෙන නර්තන සම්ප්‍රදාය වනුයේ,

1. භරතය  2. කතක්ය  3. මනිපුරිය  4. කථකලිය

24. ''ඉසුරැ දෙවිඳු වඩින දිනා - කෙහෙතු විමන රැක දෙමිනා'' මෙම කයවි අයත් වනුයේ,

1. සිංහරාජ වන්නමටය  2. සැවුලා වන්නමටය
3. වෛරොඩි වන්නමටය  4. මුසලඩි වන්නමය

25. උපුල්වන් දෙවියන්ට පූජෝපාහාර පිණිස රචනා කරන ලදැයි සැළකෙන්නේ,

1. පහතරට නර්තන සම්ප්‍රදායේ සිංදු වන්නම්ය
2. උඩරට නර්තන සම්ප්‍රදායේ පැරණි වන්නම්ය
3. සබරගමු නර්තන සම්ප්‍රදායේ වන්නම්ය
4. උඩරට නර්තන සම්ප්‍රදායේ සිංදු වන්නම්ය



Created by Universal Document Converter

26.

මෙම රූපයේ ඇති වාද්‍ය භාණ්ඩයට අයත් කොටස් තුනකි

1. බෙර ගැටිය, සුරත්තට්ටුව, සිඛාබන්ධනය
2. බෙරපුහුල, සුරත්තට්ටුව, වරපටි
3. වරපටි, වෙනිවර, ගැටිය
4. හයි තට්ටුව, හැක්ම, ඉල්ලම්මුදු

27. කප්සිටුවීම, මඩු පේ කිරීම, තොටපේ කිරීම ...... ආදිය

1. කොහොඹා කංකාරියේ පවත්වන දින චාරිත්‍ර වේ.
2. කොහොඹා කංකාරියේ පූර්ව චාරිත්‍ර වේ
3. දෙවොල් මඩු ශාන්තිකර්මයේ අවසන් දින චාරිත්‍ර වේ
4. පහන් මඩු ශාන්ති කර්මයේ අවසන් දින චාරිත්‍ර වේ

28. අතීත රාජාණ්ඩු පාලන සමයේ යුධබෙර. අණබෙර, වදබෙර සඳහා වාදනය කර ඇත්තේ,

1. උඩැක්කියට 2. දවුලයි 3. ගැටබෙරයයි 4. දඬු බෙරයයි

29. A හා B ඡායාරූපවල දැක්වෙන්නේ,

1. සබරගමු පබළු ඇඳුම් කට්ටලය හා පහතරට දෙවොල් ඇඳුම් කට්ටලයයි
2. සබරගමු පබළු ඇඳුම් කට්ටලය හා පහතරට තෙල්මේ ඇඳු මිකට්ටලයයි
3. පහතරට දෙවොල් ඇඳුමම්කට්ටලය හා උඩරට වෙස් ඇඳුම් කට්ටලයයි
4. උඩරට වෙස් ඇඳුම් කට්ටලය හා සබරගමු තෙල්මේ ඇඳුම් කට්ටලයයි

30. දක්ෂිණ භාරතයේ ප්‍රචලිත භරත නාට්‍යම් සම්ප්‍රදායේ හිසට පළඳින ආභරණ වන්නේ,

1. ජිමික්කි, ඔට්ටියානම්, මාට්ටල්
2. වංගි, අට්ටියල්, වලෙයල්
3. රාක්කොඩි, අච්ච පට්ටම්, නෙත්ති පට්ටම්
4. මොදිරම්, වංගි, වලයල්



Created by Universal Document Converter

❖ ප්‍රශ්න අංක 31 සිට 35 තෙක් ප්‍රශ්නවලට පහත වගුව ඇසුරු කර ගන්න.

| | 1 | 2 | 3 |
|---|---|---|---|
| A | මලයාලම් | අලාරිප්පු | කිංකිනි |
| B | වෙන්ඩාව | රාමායනය | හිංදුස්ථානි සංගීතය |
| C | කර්ණාටක සංගීතය | ආමද් | ක්‍රිෂ්නාට්ටම් |
| D | මෘදංගය | රාමාට්ටම් | තබ්ලාව |

31. භාරතීය නර්තනයන් සඳහා පාදක කරගත් ග්‍රන්ථයක් ඇතුලත් වන්නේ,
1. B පේළියේ 2 තීරුවේය 2. B පේළියේ B තීරුවේය
3. C පේළියේ 3 තීරුවේය 4. D පේළියේ 2 තීරුවේය

32. උතුරු ඉන්දියානි හිංදුස්ථානි සංගීතය සම්ප්‍රදායේ ප්‍රධාන වාද්‍ය භාණ්ඩය ඇතුලත් වන්නේ,
1. D පේළියේ 1 තීරුවේය 2. B පේළියේ 1 තීරුවේය
3. C පේළියේ 3 තීරුවේය 4. D පේළියේ 3 තීරුවේය

33. කථකලි අනු ගායකයා ඇතුලත් වන්නේ,
1. A පේළියේ 2තීරුවේය 2. A පේළියේ 3 තීරුවේය
3. B පේළියේ 2 තීරුවේය 4. C පේළියේ 2 තීරුවේය

34. ක්‍රිෂ්ණ චරිතය අලලා නිර්මාණය කළ නාටකය දැක්වෙන්නේ
1. C පේළියේ 3 තීරුවේය 2. C පේළියේ 2 තීරුවේය
3. D පේළියේ 2 තීරුවේය 4. B පේළියේ 2 තීරුවේය

35. කථක් නර්තනයේ නර්තන අංගයක් දැක්වෙන්නේ,
1. C පේළියේ 2 තීරුවේය 2. A පේළියේ 1 තීරුවේය
3. C පේළියේ 3 තීරුවේය 4. D පේළියේ 2 තීරුවේය

36. ලෙළදුන් නවතඹ පලුවන් පාදේ යන කවි පදය ඇතුලත් සංදේශ කාව්‍ය වන්නේ,
1. පරවි සංදේශය 2. සැළලිහිණි සංදේශය
3. ගිරා සංදේශය 4. කෝකිල සංදේශය

37. සිසී හා මන්නඩිරාල යන චරිත ඇතුලත් මුද්‍රානාට්‍යයකි
1. නිදි කුමරිය 2. ග්‍රහ අපලය 3. කරදිය 4. නල දමයන්ති

38. ''නටන ගහපතියාගේ දුව විසින් පවරා දෙන ලදි'' යනුවෙන් සඳහන්වන අනුරාධපුර යුගයට අයත් සෙල්ලිපිය වන්නේ,
1. කොරවක්ගල සෙල්ලිපිය 2. සැස්සේරුව සෙල්ලිපිය
3. ගල්පොත සෙල් ලිපිය 3. මිහින්තලා සෙල්ලිපිය

39. ආඝාතාත්මක හා අනාඝාතාත්මක ලකෂණ ඇතුලත් ජන ගී විශේෂය වන්නේ,
1. පාරු කවි 2. කරත්ත කවි 3. ටීකා සීපද 4. පතල් කවි

40. ''හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්'' ගිතය ඇතුලත් වේදිකා නාට්‍ය වන්නේ
1. බෙරහඬ 2. මනමේ 3. රාජකපුරු 4. සිංහබාහු



Created by Universal Document Converter

මහ/ ශ්‍රී රාහුල විද්‍යාලය - කටුගස්තොට

පළමු වාර පරීක්ෂණය - 2020

නර්තනය II කොටස 11 ශ්‍රේණිය

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

01. සියලුම ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ඔබගේ පිළිතුරු පත්‍රයේ අදාල ප්‍රශ්න අංකය යොදා ඉදිරියෙන් ලියන්න.

i. ප්‍රථමයෙන් උඩරට වන්නම් ගායනා කරන ලද්දේ ............. මඩුවේදීය

ii. පච්චා හා කන්ති වේෂ නිරූපණ ක්‍රම දෙක ........................ නර්තනයේ වේෂ නිරූපණයන්ය

iii. කරදිය මුද්‍රා නාට්‍යයේ මකුළුවාගේ චරිතය රංගනය කරන ලද්දේ ......... මහතාය

iv. අස්නය, හත්පදය යන ශාස්ත්‍රීය නර්තන අංග ............. නර්තන සම්ප්‍රදායට අයත් වේ.

v. සබරගමු නර්තනයේ ''කලාසම'' යන්නට සමාන වන උඩරට හා පහතරට නර්තන කොටස නම් කරන්න.

උඩරට ................

පහතරට ............

vi. කතක් නර්තන කලාවේ කතාව කියන්නා ............... යනුවෙන් හඳුන්වයි

vii. අයිලය යනු උඩරට ශාන්තිකර්මය වන ................. ප්‍රධාන සැරසිල්ලකි

viii. කථකලි නර්තන සම්ප්‍රදායේ ඇඳුම් කොටස් දෙකක් නම් කරන්න.

1. ....................
2. ....................

ix. ................. වර්ෂයේ රබීන්ද්‍රනාත් තාගෝර්තුමා ශ්‍රීපාලි ආයතනයට මුල්ගල තබන ලදි.

x. ''කරදිය'' මුද්‍රානාට්‍ය මෙන්ම චිත්‍රසේන මහතා විසින් නිර්මාණය කළ අග්‍රගන්‍ය මුද්‍රා නාට්‍යයකි ........ මුද්‍රා නාට්‍යය

02. i. සුළු මහ දෙතිතට අයත් බෙර පදයක් ප්‍රස්තාර කරන්න.

ii. ''කදුරු ගසක්'' ගෙන නියමෙට ෙ මිලෙස ගැනපන් ක විපදය මාත්‍රා 3 + 3 තනි තිතට ප්‍රස්තාර කරන්න.

iii. සැවුලා වන්නමේ අඩව්ව ප්‍රස්තාර කරන්න.

03. පහතරට සඳහන් මාතෘකා අතුරෙන් තුනක් කෙටියෙන් විස්තර කරන්න.

i. සින්දු වන්නම් ii. ඔංචිලි වාරම්

iii. තානායම් පෙළ iv. අණ බෙර

v. සතර බීජාක්ෂර

04. දේශීය ශාන්තිකර්මවල සම්ප්‍රදාය වශයෙන් පුද පූජා වෙන් වෙන්ව ඉටු කළද ආකෘතියෙහි සමානතා පවතී

i. කොහොඹා කංකාරියේ ඔබ කැමැති නතර්න අංග දෙකක් කෙටියෙන් හඳුන්වන්න.

ii. ශාන්තිකර්මවල එන සැරසිලි අතරින් ඔබ කැමති සැරසිල්ලක් පහත සඳහන් සිරස්තල යටතේ විස්තර කරන්න.

1. යොදාගන්නා අමුද්‍රවය 2. යොදාගන්නා ශිල්පක්‍රම



Created by Universal Document Converter

05. i. සොකරි හා කෝලම් නාටකවල චරිත දෙක බැගින් නම් කරන්න.

ii. කෝලම් නාටකය අතීත හා වර්තමාන අරමුණු කෙටියෙන් විස්තර කරන්න.

iii. සොකරි නාට්‍යයේ චරිත දෙක රංග වස්ත්‍රාභරණ විස්තර කරන්න.

06. පහත රූප රාමු ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. C හා D රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදාය පිළිබඳව හැඳින්වීමක් කරන්න

ii. E රූපයේ දැක්වෙන නර්තන සම්ප්‍රදායේ අංග රචනය පිළිබඳව විග්‍රහ කරන්න.

iii. A හා B රූපවල දැක්වෙන නාට්‍ය කලාවේ ආරම්භය පිළිබඳව විමසීමක් කරන්න.

07. ප්‍රාසාංගික නර්තනය සඳහා තාක්‍ෂණික උපක්‍රම භාවිතය පිළිබඳව ඔබේ අදහස් විමසුමට ලක් කරන්න.



Created by Universal Document Converter